# පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 02

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2022**

EXAMINATION GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES - 2022

## II පත්‍රය

**පැය 01 මිනිත්තු 15**

**විභාග අංකය : ..................................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.** (සමහර ප්‍රශ්නවල අනු කොටස් දී ඇත.)
- පිළිතුරු **තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට ඉරක් පමණක් අඳින්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

**නිර්මාණය : නීතිඥ ශ්‍රේෂන් කුලරත්න, හිටපු අධ්‍යක්ෂ**
(මුල් ළමාවිය සංවර්ධන සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම)
0714-500044

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

**01. පහත සඳහන් ඡේදය හොඳින් කියවන්න.**

ලංකාව ආකර්ෂණීය සුන්දර දිවයිනකි. එක් සෞන්දර්යාත්මක ලේඛකයෙකු සටහන් කළ පරිදි "සුළඟින් පිවිසෙන්නේ සුමිහිරි සුවඳකි. මෙහි ඇත්තේ ඉතා ම දුර්ලභ වටිනා වෘක්ෂයන්ගෙන් යුත් වනාන්තරයකි. මේ දිවයිනේ අනර්ඝතම මැණික වශයෙන් සලකන්නේ දියමන්තියයි." නෞකාවේ සිටි සියල්ලන්ගෙන් අපි දෙදෙනෙක් පමණක් කිසිම දිනක මේ දිවයිනේ සංචාරය කර නැත්තෙමු.

■ **ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම තෝරාගෙන තිත් ඉරි මත ලියන්න.**

(i). ඡේදයට අනුව මෙම දිවයිනේ අනර්ඝතම මැණික කුමක් ද? ..............................................

(ii) ඡේදයට අනුව මේ දිවයිනේ සංචාරය නොකළ සංඛ්‍යාව කොපමණ ද?.............................

(iii) "දූපතේ" යන්නට සමාන අර්ථය දෙන වචනයක් ඡේදයෙන් තෝරාගෙන ලියන්න.

..........................................................................................................................

(iv) මෙහි සඳහන් උත්තම පුරුෂ බහුවචන ක්‍රියා පදයක් තෝරා ලියන්න.

..........................................................................................................................

(v) ඡේදයට ගැළපෙන මාතෘකාවක් දී ඇති මාතෘකා අතරින් තෝරාගෙන යටින් ඉරක් අඳින්න.

I. නෞකාවකින් චාරිකාවක්

II. ලංකාවේ සුන්දරත්වය

III. ශ්‍රී ලංකාවේ දියමන්ති මැණික

(vi) ඡේදයේ සඳහන් විශේෂණ පදයක් තෝරා ලියන්න. ..........................................................

**02. පහත සඳහන් වචන සියල්ලම යොදා ගනිමින් අර්ථවත් වාක්‍යයක් තිත් ඉර මත ලියන්න.**

(i) සිදු / තද / හේතුවෙන් / සුළඟ / නිවාසවලට / විය / හානි

..........................................................................................................................

(ii) ප්‍රදර්ශනයට / වූවා / ඇය / ය /පොත් / සහභාගී

..........................................................................................................................

**03. පහත සඳහන් වචනවලට විරුද්ධාර්ථ වචන තිත් ඉරි මත ලියන්න.**

(i) පිපෙනවා ........................................ (ii) ආරම්භය ....................................

**04.** (i) **"ගැට ඇලපිල්ල" යෙදුණු වචනය තෝරාගෙන යටින් ඉරක් අඳින්න.**

ප්‍රතිමාවක් /ගෘහය / ඖෂධ

(ii) **"යංශය" යෙදුණු වචනය තෝරාගෙන යටින් ඉරක් අඳින්න.**

දක්ෂ / අවශ්‍ය / සෛල

**05. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

(i) හාවා කැරට් අලය දෙස ආශාවෙන් ................................ (බැලුවේ ය. / බැලුවෝ ය.)

(ii) .............................. (නංගි / අයියා) අලුත් ඇඳුමකින් සැරසුණා ය.

(iii) නංගී සහ අක්කා පලතුරු සලාද ............................ (සාදති / සාදයි)



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

විභාග අංකය : ..................................................

**06.** **ගැළපෙන විරාම ලකුණු යොදා නැවත ලියන්න.**

මැදැගිල්ල තමයි ලොක්කා නංගි උත්තර දුන්නා ..................................................................................

**07.** **පහත සඳහන් ස්ත්‍රී ලිංග පදයට ගැළපෙන පුරුෂ ලිංග පදය තිත් ඉරි මත ලියන්න.**

(i) ගුරුවරියක් - ..................................... (ii) මවක - ..............................

**08.** **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.**

මඩේ හිටවූ ............................ වගේ

**09.** **පහත සඳහන් කවියේ හිස්තැනට ගැළපෙන කවි පදය ලියන්න.**

මුළු ලෝකයෙ හැම දෙනෙක් ම - අප දැකලා සතුටු වෙනවා
හිතේ තියන දුක් කරදර - ..............................................

**10.** **පහත සඳහන් යෙදුමට වඩාත් ගැළපෙන අදහස වරහන් තුළින් තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

**අබ මල් රේණුවක් ...............** (ඉතාම කුඩා ප්‍රමාණයක් / දැඩි බයාදු කමක්)

**11.** **පහත සඳහන් එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න.**

(i) elephant ........................................ (ii) mango ...................................

**12.** **රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**

.................................



**13.** **පහත දී ඇති ඉංග්‍රීසි වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

(i) I .................................. (am / is) reading a book.

(ii) This..............................(are / is) my table.

**14.** **"මාණවන්" යන දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.** ......................................................

**15.** **මෙම වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

තේ බොන්න ..................................................................

**16.** **විසි එක් දහස් දහය යන සංඛ්‍යාවෙන් 1 ක් අඩු කළ විට ලැබිය යුතු සංඛ්‍යාව තිත් ඉර මත ඉලක්කමෙන් ලියන්න.** ...............................................................................................

**17.**

| 5 | 0 |
|---|---|
| 4 | 9 |

**පෙන්වා ඇති කාඩ් පත්‍ර හතරේ ඉලක්කම් සියල්ලම යොදා ගනිමින් සකස් කළ හැකි කුඩා ම සංඛ්‍යාව ලියන්න.**

...........................................................


**18.** **පහත සඳහන් සංඛ්‍යා නාම රෝම සංඛ්‍යාවලින් ලියන්න.**

(i) අට ............................ (ii) හතර ............................

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

[හතරවැනි පිටුව බලන්න.]

**19.** (i) පහත සඳහන් රූපයෙන් 0.6 ක් පාට කිරීමට අවශ්‍යව ඇත. ඒ සඳහා තව කොටු කීයක් පාට කළ යුතු ද?



..............................

(ii) දිලුම් පිටු 36 ක පොතකින් 3/4 ක් ම කියවා අවසන් බව කියයි. ඒ අනුව ඔහු කියවා ඇති පිටු සංඛ්‍යාව කොපමණ ද? ..............................

**20.** මෙම හැඩතල සියල්ල ම යොදාගෙන සකස් කළ හැකි ඝන වස්තුවේ නම ලියන්න.

..............................

**21.** හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා ලියන්න.

(i) 13, 20, ............, 34, 41 (ii) ............., 54, 63, 72, 81

**22.** පහත සඳහන් මිල දර්ශනය බලන්න.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල | |
|---|---|---|---|
| | | රු. | ශත |
| පැන්සල් | 2 | 11 | 00 |
| පෑන් | 1 | 20 | 00 |
| පොත් | 1 | 40 | 00 |


ඉහත මිල දර්ශනය ඇසුරින් පහත බිල් පතුයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| මිලදී ගත් ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල | |
|---|---|---|---|
| | | රුපියල් | ශත |
| පැන්සල් | ................ | 16 | 50 |
| පෑන් | 2 | ...... | ........ |
| පොත් | 2 | 80 | 00 |
| | එකතුව | ......... | ...... |

**23.** තේ හැන්දකට අල්ලන දියර ප්‍රමාණය 5ml කි. වෛද්‍යවරයෙක් රෝගියෙකුට කිසියම් දියර බෙහෙතක් වරකට තේ හැදි 2 බැගින් දවසකට තුන් වරක් දවස් තුනක් බීමට නියම කළේ ය. මේ අනුව රෝගියා බොන මුළු බෙහෙත් ප්‍රමාණය කොපමණ ද?............................

**24.** තරාදියේ තිබෙන මාළුවාගේ නියම බර කොපමණ ද?

..............................




**25.** පරිත්‍යාගශීලියෙකු විසින් පාසල්වලට බෙදා දීම සඳහා බෝල 722 ක් ලබා දී තිබේ.

(i) පාසලකට 3 බැගින් මෙම බෝල බෙදා දුන්නේ නම් පාසල් කීයකට බෝල ලබා දිය හැකි ද? ..........................


(ii) ඉතිරි බෝල ගණන කොපමණ ද? .....................


**26.** **පහත සඳහන් වන්නේ A, B, C, D, E, සහ F නගරවල පිහිටීම ය.**

(i) **F නගරයේ සිට A නගරය හරහා C නගරයට ගමන් කරන අයෙකු යා යුතු දුර කොපමණ ද?**

..............................................................................

(ii) **F නගරය පිහිටා තිබෙනුයේ A නගරයට කුමන දිශාවෙන් ද?** ..................................................





**27.** 


**මෙම ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව පැය 12 ඔරලෝසු වේලාවෙන් ලියන්න.**

............................................

**28.** **පහත සඳහන් වන්නේ නිවසක ජනේලයකි. මෙම ජනේලයේ A නමැති ස්ථානයේ දක්නට ලැබෙන කෝණය කුමක්දැයි නම් කරන්න.** ......................................




**29.** **පහත සඳහන් වන්නේ විවිධ කැවිලිවලට කැමති සිසුන් කණ්ඩායමක් පිළිබඳ තොරතුරු දැක්වෙන ප්‍රස්තාර සටහනක් හා වගු සටහනකි. එය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


| කැවිලි වර්ගය | කැවුම් | කොකිස් | අලුවා | අතිරස |
|---|---|---|---|---|
| සිසුන් සංඛ්‍යාව | 8 | 16 | 14 | ............ |

(i) අලුවා නමැති කැවිලි වර්ගයට කැමති සිසුන් සංඛ්‍යාව ප්‍රස්තාරයේ ලකුණු කරන්න.

(ii) "අතිරස" නමැති කැවිලි වර්ගයට කැමති සිසුන් සංඛ්‍යාව වගුවේ සඳහන් කරන්න.

(iii) මුළු සිසුන් සංඛ්‍යාවෙන් 1/3 ක් ම කැමති කැවිලි වර්ග මොනවා ද?

..............................................................................




■ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

**30.** **පහත සඳහන් මල් අතරින් පොකුරු කාණ්ඩයට අයත් මලකි.**

(1) අරලිය (2) සූරියකාන්ත (3) ඉද්ද

**31.** **"ඇස් වසාගන්න සෙමන් සෙමෙන් අත් පා සැහැල්ලු කරගන්න" මෙම පැහැදිලි කිරීම ඇතුළත් සුවපත් කිරීමේ ක්‍රියාකාරකම කුමක් ද?**

(1) ශාරීරික ලිහිල් බව (2) මානසික ලිහිල් බව (3) අධිෂ්ඨානය



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

**32. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,**

(1) වලිකුකුළා ය. (2) සැළලිහිණියා ය. (3) පරෙවියා ය.

**33. පදිංචිය පිළිබඳ සහතිකයක් ලබාගැනීමට යා යුතු ස්ථානයකි.**

(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2) ග්‍රාම නිලධාරි කාර්යාලය (3) ප්‍රාදේශීය සභාව

**34. කාලයකට වරක් මල් පිපෙන ශාකයකි.**

(1) මැයි මල් (2) කෙසෙල් (3) පැපොල්

**35. රසවත් ව්‍යාංජනයක් පිළියෙල කර ගත හැකි මල් විශේෂයකි**

(1) කොස් (2) කතුරුමුරුංගා (3) රණවරා

**36. බීජ ව්‍යාප්තියට උදව් කරන සතෙකි**

(1) වවුලා (2) මී මැස්සා (3) ලේනා

**37. පස් අතර ජීවත්වන සතෙකි.**

(1) ඉත්තෑවා (2) ගැඩවිලා (3) මීයා

**38. සතුන්ගේ පැවැත්මට අහිතකර ක්‍රියා අතරට අයත් නොවන කරුණ කුමක් ද?**

(1) උණු වතුර බිමට හැලීම

(2) පොළොවට කොම්පෝස්ට් පොහොර යෙදීම. (3) ගස් කැපීම


**39. සුළඟ මගින් ව්‍යාප්ත වන බීජයකි.**

(1) රබර් (2) තුත්තිරි (3) වරා

**40. ලෝක උරුමයක් වශයෙන් සංරක්ෂණය කරනු ලබන වනාන්තරයකි.**

(1) සිංහරාජය (2) වස්ගමුව (3) විල්පත්තු

**41.**



**මෙම රූපයේ දැක්වෙන රටේ කීර්ති නාමය නැංවීමට දායක වූ චරිතය හිමි අය කවුරුන් ද?**

(1) අනගාරික ධර්මපාල තුමා

(2) ගොංගාලේ ගොඩබණ්ඩා තුමා

(3) මොණරවිල කැප්පෙටිපොළ දිසාව තුමා



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

**42.** 
**රූපයේ දැක්වෙන ලාංඡනය අයත් රාජ්‍ය ආයතනය කුමක් ද?**

(1) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

(2) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

(3) ශ්‍රී ලන්කන් ගුවන් සේවය

**43. කැපීමෙන් පසු සෝදා නොගන්නා ආහාර වර්ගයකි.**

(1) කරවිල (2) වට්ටක්කා (3) මුකුණුවැන්න

**44. බිත්තියක සිරස් බව හඳුනා ගැනීම සඳහා යොදාගන්නා උපකරණයකි.**

(1) මට්ටම් ලීය (2) ලඹය (3) ලෙවලය



**45. අමුවෙන් ආහාරයට ගත හැකි එළවළුවකි.**

(1) බීට් (2) බෝංචි (3) පිපිඤ්ඤා

**46. ජලයේ හොඳින් දියවන ද්‍රව්‍යයකි.**

(1) නිල් (2) කොන්ඩිස් (3) කහ

**47. ලියකට යකඩ ඇණයක් සවිකර ගැනීමේ දී මිටිය අල්ලා ගත යුතු නිවැරදි ක්‍රමය පෙන්වන රූපය කුමක් ද?**

(1) 
(2) 
(3) 

**48. සාමූහිකව ජීවත්වීමේ දී අප සතු විය යුතු ගුණාංග අතරට නොගැළපෙන කරුණ කුමක් ද?**

(1) තමාගේ මතය අන් අයට පිළිගැනීමට සැලැස්වීම




(2) කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම

(3) අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කරමින් අභියෝග ජය ගැනීම.


**49. මදුරුවන්ගෙන් බෝවන රෝගයකි.**

(1) සරම්ප (2) බරවා (3) කොළරාව

**50. පහත දැක්වෙන විද්‍යුත් චුම්බකයේ චුම්බක ශක්තිය වැඩියෙන් ම පිහිටන ස්ථානය නිවැරදි ව දැක්වෙන රූපය කුමක් ද?**

(1) 
(2) 
(3) 

**51. මෙම රූපයෙන් දැක්වෙන උපකරණය භාවිත කිරීමෙන්**




(1) සුළඟේ වේගය මැනගත හැකි ය.

(2) සුළං හමන දිශාව හඳුනාගත හැකි ය.

(3) අකුණුවලින් ආරක්ෂා විය හැකි ය.



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB

**52.** **දිස්ත්‍රික්ක තුනක් සහිත පළාතකි.**

(1) ඌව (2) උතුර (3) මධ්‍යම

**53.** **ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ පිහිටා ඇත්තේ,**

(1) කටුනායක ය. (2) මත්තල ය. (3) රත්මලාන ය.

**54.** **පරිසර හිතකාමී කෘමිනාශකයක් සාදා ගැනීම සඳහා වඩාත් යෝග්‍ය බීජ වර්ගයකි.**

(1) කොහොඹ (2) අබ (3) ගස්ලබු

**55.** **සාමූහික ක්‍රීඩාවල දී නොතිබිය යුතු ගුණාංගය මින් කුමක් ද?**

(1) නායකත්වයට ගරු කිරීම (2) තමාගේ කාර්ය උපරිම අයුරින් ඉටු කිරීම

(3) තමාට කැමති අයුරින් කටයුතු කිරීම

**56.** **කාන්දමක් ළං කළ විට ඇදී එන්නේ මින් කුමන ද්‍රව්‍යය ද?**

(1) පිත්තල (2) ඇස්බැස්ටෝස් (3) යකඩ

**57.** **සුළු පිලිස්සීමක දී භාවිත කෙරෙන ශාක වර්ගයකි.**

(1) රණවරා (2) කෝමාරිකා (3) පැපොල්

**58.** **බෝග වගාවට අහිතකර ව ක්‍රියා කරන සතෙකි.**

(1) පුරුක් පණුවා (2) ගැඩවිලා (3) බකමූණා

**59.** **බැද්ද වටට සුදු මොරමල් පිපිලා - සද්ද කර බඹරු ඒ මග තියලා**

**මෙම කවිය කුමන වර්ගයට අයත් කවියක් ද?**

(1) නෙළුම් කවියකි (2) බඹර කවියකි (3) කරත්ත කවියකි

**60.** **ශ්‍රී ලංකාව අප සැමගේ මවුබිම ය. ඇය අපට කළ සේවය වෙනුවෙන් අප ද පෙරළා ඇයට සේවය කළ යුතු ය. පෙර විරුවන් ලක්මව වෙනුවෙන් කළ සේවය අමිල ය. ඔබ ද එවන් පරපුරේ දරුවෙක් බව සිහිකරමින් "ලක්මව වෙනුවෙන් මා කළ යුතු උදාර සේවය" යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට වඩා වැඩි විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)**

**(i)** ........................................................................................................................................

........................................................................................................................................

**(ii)** ........................................................................................................................................

........................................................................................................................................

**(iii)** ........................................................................................................................................

........................................................................................................................................

## පෙරහුරු ප්‍රශ්න පත්‍රය - අංක 02
## II පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | | පිළිතුරු | ලකුණු |
|---|---|---|---|
| 01. | (i) | දියමන්තිය | 1 |
| | (ii) | දෙදෙනෙක් | 1 |
| | (iii) | දිවයිනේ | 1 |
| | (iv) | නැත්තෙමු. | 1 |
| | (v) | (ii) ලංකාවේ සුන්දරත්වය | 1 |
| | (vi) | සුන්දර / සුමිහිරි / සුන්දරත්වය / අනර්ඝතම | 1 |
| 02. | (i) | තද සුළඟ හේතුවෙන් නිවාසවලට හානි සිදු විය. | 1 |
| | (ii) | ඇය පොත් ප්‍රදර්ශනයට සහභාගී වූවා ය. | 1 |
| 03. | (i) | පරවෙනවා (ii) අවසානය | 2 |
| 04. | (i) | ගෘහය (ii) අවශ්‍ය | 2 |
| 05. | (i) | බැලුවේ ය (ii) නංගි (iii) සාදති | 3 |
| 06. | | "මැදැගිල්ල තමයි ලොක්කා" නංගි උත්තර දුන්නා. | 1 |
| 07. | (i) | ගුරුවරයෙක් (ii) පියෙකු | 2 |
| 08. | | මඩේ හිටවූ ඉන්නක් වගේ | 1 |
| 09. | | හැම දෙයක් ම නිවිලා යනවා | 1 |
| 10. | | ඉතාම කුඩා ප්‍රමාණයක් | 1 |
| 11. | (i) | අලියා (ii) අඹ | 2 |
| 12. | (i) | Blackboard | 1 |
| 13. | (i) | am (ii) is | 2 |
| 14. | | ශිෂ්‍යයා | 1 |
| 15. | | තේනීර් කුඩියුංගළ් | 1 |
| 16. | | 21009 | 2 |
| 17. | (i) | 4059 | 2 |
| 18. | (i) | VIII (ii) IV | 2 |
| 19. | (i) | කොටු 2 යි. | 2 |
| | (ii) | 27 | 2 |
| 20. | | ඝනකය | 2 |
| 21. | (i) | 27 (ii) 45 | 2 |
| 22. | (i) | පැන්සල් 3 (ii) රුපියල් 40.00 (iii) රුපියල් 136.50 | 3 |
| 23. | | 90ml | 2 |
| 24. | | 3kg 750g | 2 |
| 25. | (i) | 240 | 2 |
| | (ii) | ඉතිරි බෝල 2 යි. | 1 |
| 26. | (i) | 22 km | 2 |
| | (ii) | නැගෙනහිර දිශාව | 1 |
| 27. | | පස්වරු 11.45 | 2 |
| 28. | | සෘජුකෝණය | 2 |
| 29. | (i) | නිවැරදි ප්‍රමාණයට ඇඳ ලකුණු කර තිබිය යුතුයි. | 1 |
| | (ii) | 7 | 1 |
| | (iii) | කැවුම් සහ අතිරස | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|
| 30) | 2 |
| 31) | 1 |
| 32) | 1 |
| 33) | 2 |
| 34) | 1 |
| 35) | 2 |
| 36) | 1 |
| 37) | 2 |
| 38) | 3 |
| 39) | 3 |
| 40) | 1 |
| 41) | 1 |
| 42) | 3 |
| 43) | 3 |
| 44) | 2 |
| 45) | 3 |
| 46) | 2 |
| 47) | 2 |
| 48) | 1 |
| 49) | 2 |
| 50) | 3 |
| 51) | 2 |
| 52) | 3 |
| 53) | 2 |
| 54) | 1 |
| 55) | 3 |
| 56) | 3 |
| 57) | 2 |
| 58) | 1 |
| 59) | 2 |

(ලකුණු 1 x 30)

60) දෙන ලද උපදෙස් අනව නිවැරදි වාක්‍ය තුනක් ලියා තිබිය යුතුයි. (ලකුණු 6 යි)

**සමස්ත පිළිතුරු පත්‍රයේම අත් අකුරු සහ ඉලක්කම් සලකා බලා අතිරේක ලකුණු 02 ක් ප්‍රදානය කරන්න.**

**මුළු ලකුණු 100**

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිළිණයකි. NSB